**පලතුරු සංවර්ධන මණ්ඩලය 2013**

පලතුරු සංවර්ධන මණ්ඩලයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 13(6) වගන්තිය ප්‍රකාර ඉදිරිපත් කළයුතු 2013 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දින වනවිටත් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළයුතු යැයි අදහස් කරන මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ ඇතුළත් වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

**2002 මැයි 24 දිනැති අංක පීඊ/පීඑෆ් 21 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 2 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්** 2002 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා වූ මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තා විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

## 2.2 ක්‍රියාකාරිත්වය

2001 වර්ෂයෙන් පසු මණ්ඩලයේ කටයුතු අක්‍රීය වි තිබුණු අතර, ඊට අදාලව කාර්ය මණ්ඩලයක් හා පාලන මණ්ඩලයක්ද නොතිබුණි. තවද මණ්ඩලයේ ඇවර කටයුතු 2012 දෙසැම්බර් 31 දිනට පෙර අවසන් කිරීමට 2012 දෙසැම්බර් 05 වැනි දින රැස්වූ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව නියෝග කර තිබුණද, අමාත්‍යාංශය විසින් මණ්ඩලයේ ඇවර කටයුතු 2013 දෙසැම්බර් 31 දින වනවිටත් නිමකර නොතිබුණි.

## 2.3 මූල්‍ය ප්‍රකාශන, පොත්පත් හා ලේඛන පැවැත්වීම

සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන, පොත්පත් හා ලේඛන පැවැත්වූ බවට කිසිඳු සාක්ෂියක් විගණනයට ඉදිරිපත් නොවීය.

## 2.4 වත්කම් හා වගකීම්වල පැවැත්ම

මණ්ඩලය විසින් අවසන් වරට පිළියෙල කරන ලද 2001 දෙසැම්බර් 31 දිනට වූ ශේෂ පත්‍රයේ වත්කම් හා බැරකම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| වත්කම් | වටිනාකම | බැරකම් | වටිනාකම |
|---|---|---|---|
| | රු. | | රු. |
| ස්ථාවර තැන්පතු | 5,480,400 | ගෙවිය යුතු බැංකු පොළී සඳහා බදු | 73,654 |
| ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොළී | 736,545 | උපචිත වියදම් | 500 |
| බැංකු ඉතිරිය | 975,449 | | |

රාජ්‍ය බැංකුවක ස්ථාවර තැන්පතු 03 ක රු. 5,552,400 ක මුදලක් මණ්ඩලය විසින් ආයෝජනය කර තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට ගිණුම් වල ශේෂය රු.6,569,743 ක් විය. මණ්ඩලය වෙනත් රාජ්‍ය බැංකුවක පවත්වාගෙන යන ජංගම ගිණුමක සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.7,094,706 ක ශේෂයක් පැවතුණි. ඒ හැර ඉහත වත්කම් හා වගකීම් සනාථ කිරීම සඳහා කිසිදු සාක්ෂියක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.